ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025-02-18

ආර්.ඩී.ඒ.ඩබ්.ආරියපාල
අංක782, ගැමුණුපුර,
අම්පාර.

පැමිණිලිකරු

01. මේජර් ජනරාල් (විශ්‍රාමික) සාරද සමරකෝන්
සභාපති (හිටපු),
සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම,
සෙවනගල.

02. මේජර් (විශ්‍රාමික) වජිර කුමාරතුංග,
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී (හිටපු),
සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම,
සෙවනගල.

03. කැලුම් ප්‍රියංකර,
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී (හිටපු),
සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම,
සෙවනගල.

04. ඉන්දික ජයන්ජු හතරසිංහ,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්),
සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම,
සෙවනගල.

වගඋත්තරකරුවන්

**පැමිණිලි අංකය : HRC/AM/105/24**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු විසින් ඉහත අංක දරණ පැමිණිල්ල 2024.08.29 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2023.08.01 වන දින සිට 2024.07.31 වන දින දක්වා වසරක කාලයක් සඳහා සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් කළමණාකාර



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman — 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone — 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary — 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

(තොරතුරු තාක්ෂණය M2 - 2) තනතුර සඳහා තමා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ බවත්, එකී කොන්ත්‍රාත් කාලය අවසන් වීමට ප්‍රථම එනම්, 2024.03.06 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමණාකාර (තොරතුරු තාක්ෂණය M2 - 2) තනතුර සඳහා තමා ස්ථිර පදනමින් බඳවාගන්නා බවට අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති එවකට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ගාමිණී රාසපුත්‍ර මහතාගේ අත්සනින් යුත් පත්වීම් ලිපිය ලැබුණු බවත් ය.

එලෙස ස්ථිර පත්වීම් ලිපිය ලබා දුන්න ද තමා හට ස්ථිර සේවයේ වැටුප්, නිවාඩු හා අනෙකුත් දීමනා ලබා නොදුන් බවත්, එසේහෙයින් පත්වීමේ ලිපිය අනුව කටයුතු නොකිරීම පිළිබඳව (පත්වීමට අදාල වැටුප, දීමනා,නිවාඩු ආදිය) තමා හා අනෙක් ස්ථිර පත්වීම් ලාභීන් විසින් 2024.06.04 වන දින පාලනාධිකාරියෙන් කරුණු විමසීමෙන් පසුව 2024.06.25 වන දින තමා ඇතුළු අනෙක් ස්ථිර පත්වීම් ලාභීන් පස්දෙනා විසින් කූඨ ලේඛන සකස් කිරීමක් කළ බවට වගඋත්තරකාර පාර්ශවය විසින් ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන ඒකකයට පැමිණිලි කරන ලද බවත්, ඒ අනුව ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ නඩු කටයුත්තක් පවතින බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

ඉන්පසුව අංක LSS/AD/HR/01/54 සහ 2024.07.31 වන දිනැති ලිපිය මගින් තම කොන්ත්‍රාත් සේවා කාලය 2024.07.31 වන දින සිට අවසන්කරන බවට එවකට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී මේජර් (විශ්‍රාමික) වජිර කුමාරතුංග මහතාගේ අත්සනින් යුත් ලිපිය ලැබුණු බව ද පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව තම රැකියාව අහිමි වූ බවත්, සේවා අවශ්‍යතාවය තිබියදී සේවය දීර්ඝ නොකර සේවය අවසන් කිරීම හේතුවෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් තමා හට රැකියාව කරගෙන යාමට ඇති අයිතිය කඩකර ඇති බවත්, කොන්ත්‍රාත් පදනම අවසන් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති චෝදනා තම සේවය අවසන් කිරීම සඳහම ලිපි ලේඛන පසුව සකස්කර ගොණු කරනු ලැබූ චෝදනා බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

ඉහත කී අංක LSS/AD/HR/01/54 සහ 2024.07.31 දිනැති කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරීමේ ලිපිය මගින් පැමිණිලිකරුට එරෙහිව චෝදනා තුනක් ඉදිරිපත් කර ඇති බවත්, එහි පළමු චෝදනාව වන 2024.07.17 දින විනය නියෝගයකට යටත්කිරීම සිදුකර ඇති බව දන්වා තිබුණ ද, එකී නියෝගය චෝදනා පත්‍රයක් ලබාදී සාධාරණ කරුණු විමසීමක් නොකර මූලික විමර්ශනයක් පමණක් කර ලබාදී ඇති විනය නියෝගයක් බවත්, එයද තමාට ලැබුණේ 2024.08.17 දින ලියාපදිංචි තැපෑලෙන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

දෙවන චෝදනාව ලෙස කූඨ ලේඛන සැකසීම සම්බන්ධයෙන් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ අධිකරණ ක්‍රියාමාර්ග පවතින බව දක්වා තිබෙන බවත්, එකී නඩු කටයුත්ත වගඋත්තරකාර පාර්ශවය විසින් තමා කළමණාකාර (තොරතුරු තාක්ෂණය M2 - 2) තනතුර සඳහා

ස්ථිර පදනමින් බඳවාගන්නා බවට ලබාදුන් අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති එවකට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ගාමිණී රාසපුත්‍ර මහතාගේ අත්සනින් යුත් පත්වීම් ලිපිය කූඨ ලේඛනයක් බවට ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන ඒකකයට අසත්‍ය පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හේතුවෙන් පවරන ලද්දක් බවත්, මේ වන විට ඉහත කී අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති ලිපිය කූඨ ලේඛනයක් නොවන බවට හඳුනාගෙන ඇති බවට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ඉන්දික ජයන්ප්‍ර හතරසිංහ මහතා විසින් ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන ඒකකයට ප්‍රකාශයක් ලබා දී ඇති බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

තෙවන චෝදනාව ලෙස ආයතනයේ සාමාන්‍යයෙන් සලකා බලනු ලබන වැටුප් රහිත නිවාඩු 10 ඉක්මවා වැටුප් රහිත නිවාඩු සීමාව ඉක්මවා ලබා තිබීම ලෙස දක්වා තිබුණ ද, එය සිදුව ඇත්තේ තමා 2024.03.06 දිනැති ලිපිය අනුව සේවය ස්ථිර කළ නිලධාරියෙකු බැවින් නිවාඩු විධිමත් පරිදි අනුමත කර ලබා ගැනීමට වගඋත්තරකාර පාර්ශවය විසින් අවස්ථාව ලබා නොදීම හේතුවෙන් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

එලෙස තම ඉල්ලීම් කිසිවකට ප්‍රතිචාර නොදක්වා අභූත චෝදනා එල්ල කරමින් දිගින් දිගටම වගඋත්තරකාර පාර්ශවය විසින් තමාගේ අයිතිවාසිකම් කඩකර ඇති බවත්, එබැවින් ස්ථිර සේවයේ වැටුප, හිඟ වැටුප් සහිතව ගෙවීමටත්, නැවත රැකියාව ලබාදීමටත්, ඒ අනුව හිමි නිවාඩු හා අනෙකුත් සියලු දීමනා ගෙවීමටත්, තමාට සිදුවූ අසාධාරණය හා අපහාසය වෙනුවෙන් රුපියල් ලක්ෂ 30 ක වන්දි මුදලක් ආයතනය මගින් ගෙවීමටත් වගඋත්තරකාර නිලධාරීන් වෙත දන්වන ලෙස පැමිණිලිකරු විසින් මෙම පැමිණිල්ල මගින් ඉල්ලා ඇත.

<u>වගඋතත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

උක්ත පැමිණිල්ලට අදාලව කොමිෂන් සභාව විසින් සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම සෙවනගල වෙතින් වාර්තා කැඳවීම සිදු කළ අතර 02 වන වගඋත්තරකාර සෙවනගල සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ හිටපු අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී මේජර් (විශ්‍රාමික) වජිර කුමාරතුංග මහතා විසින් අංක LSS/LE/01/06 සහ 2024.10.03 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, අංක LSS/AD/HR/01/08 සහ 2023.08.01 දිනැති කොන්ත්‍රාත් පදනමේ ලිපිය අනුව පැමිණිලිකරුගේ සේවය 2024.07.31 දිනෙන් අවසන් වීමට නියමිතව තිබූ බවත්, ඒ අනුව ඔහුගේ සේවය අවසන් කළ බවත්, තවදුරටත් සේවය දීර්ඝ කිරීම සළකා බැලීමට ඔහු වෙත එල්ලවී තිබූ චෝදනා හේතුවෙන් වගඋත්තරකරුවන් වෙත අවකාශයක් නොතිබූ බවත් ය.

තවද, පැමිණිලිකරු විසින් කූඨ ලේඛනයක් සකස්කොට ඔහුගේ පත්වීම ස්ථිර කලා යැයි කීමට ගත් උත්සාහයක් හේතුවෙන් ඒ සම්බන්ධව ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන ඒකකයට පැමිණිලි කිරීමෙන් අනතුරුව එම ඒකකය විසින් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ

නඩු පවරා මේ වන විට සාපරාධී වරදක් සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව නඩු කටයුත්තක් පවත්වාගෙන යන බවත්, ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඔහුගේ සේවය ස්ථිර කරා යැයි දක්වා ඇති පත්වීම් ලිපිය අනුව වගඋත්තරකරුවන්ට කටයුතු කිරීමට නොහැකිවී ඇත්තේ ඒ සම්බන්ධයෙන් දැනටමත් අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතින බැවින් බවත් එකී වාර්තාව තුළින් දක්වා ඇත.

එසේම, ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ සේවය ස්ථිර කිරීමට තීරණයක් ගෙන නොමැති බවත්, ඔහු විසින් සකස් කරගත් කූට ලේඛනයක් මත පදනම්ව එසේ කියා සිටින බවත්, නඩුවේ තීන්දුව අනුව ඒ සම්බන්ධව ක්‍රියා කළ හැකි බවත්, ස්ථිර නිලධාරියකුට හිමි නිවාඩු සම්බන්ධයෙන් හිමිකමක් ඔහු වෙත නොමැති බවත් ඉහත කී වාර්තාවේ සඳහන් කර ඇත. 2023.08.01 දින සිට කොන්ත්‍රාත් පදනමින් පත්වීමේ ලිපිය අනුව ඔහු සෙවනගල සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සේවය කළ බවත්, පැමිණිල්ල සඳහන් කර ඇති පරිදි ඔහුගේ රාජකාරි ප්‍රශස්ථ හා ඵලදායී ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට ඔහු විසින් කටුතු නොකළ බවත්, නිරන්තරයෙන් ඔහුගේ රාජකාරී පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී අඩුපාඩු හඳුනා ගැනීමට හැකියාව ලැබුණු බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් ස්වකීය වාර්තාව තුළින් දක්වා ඇත.

තවද, පැමිණිලිකරු ඔහුගේ වෘත්තියට අදාලව කිසිඳු ඵලදායී ආකාරයකට රාජකාරී කටයුතු නොකළ බවත්, සභාපති හෝ සෙසු වගඋත්තරකාර නිලධාරීන් ඔහුගේ රාජකාරී කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වීමක් හෝ බලපෑමක් නොකළ බවත්, ඔහුට ස්වාධීනව රාජකාරී කිරීමට අවස්ථාව ලබාදී තිබූ බවත් එකී වාර්තාවේ දක්වා ඇත. පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට අදාළ පත්වීම් ලිපිය ප්‍රකාරව ඔහුගේ සේවය අවසන් කර ඇති බවත්, ඔහු විසින් ඉදිරිපත් කළ ව්‍යාජ ස්ථිර පත්වීම් ලිපියක් සම්බන්ධයෙන් දැනටමත් අධිකරණ කටයුත්තක් ක්‍රියාත්මක වන බැවින් මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ආයතනයට හැකියාවක් නොමැති බවත්, ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමකට ආයතනය කටයුතු කර නොමැති බවත්, ඔහුගේ රැකියාව ඉහත කී කොන්ත්‍රාත් කාලය තුලද කිසිඳු ආකාරයක ආයතනය අපේක්ෂා කළ ප්‍රශස්ථ හා ඵලදායී මට්ටමක නොතිබූ බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් වැඩිදුරටත් දක්වා ඇත.

<u>පැමිණිලිකරුගේ විරෝධතා</u>

පැමිණිලිකාර පාර්ශවය විසින් වගඋත්තරකාර පාර්ශවයේ ඉහත වාර්තාව සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, සේවා අවශ්‍යතාවය තිබියදී අංක LSS/AD/HR/01/54 සහ 2024.07.31 දිනැති ලිපිය ප්‍රකාරව 2024.07.31 දින තම කොන්ත්‍රාත් සේවය අවසන් කළ බවත්, එහෙත් තමාගේ පත්වීමට සමගාමීව විවිධ තනතුරු සඳහා බඳවාගත් සේවකයන් 30 දෙනකු පමණ 2024.08.30 දිනට කොන්ත්‍රාත් සේවා කාලය අවසන් වුවද ඔවුන්ව වැටුප් හා දීමනා ගෙවමින් මේ දක්වා සේවයේ රඳවාගෙන සිටින බවත්, තමාගේ සේවය පමණක් අවසන් කළ බවත්, ඒ වන විට ලබා දෙන ලද ස්ථිර පත්වීමට අනුව එම වැටුප සමඟ හිමි දීමනා නිවාඩු ආදිය ලබා ගැනීමට බාධා පමුණුවමින් කොන්ත්‍රාත්

සේවයද අවසන්කර රැකියා විරහිත පුද්ගලයකු බවට තමාව පත්කරන ලද බවත් ය. එබැවින් මේ වන විට තම දරු පවුල හා තමා විශාල ආර්ථික දුෂ්කරතාවයන්ට පත්ව සිටින බවත්, පාසල් වයසේ පසුවන තම දරුවන්ටද පාසල් යාමට හා ජීවත්වීමට කිසිඳු පිලිසරණක් නොමැති තත්වයට පත්ව ඇති බවත්, එබැවින් නැවත සේවයේ පිහිටුවීමට නිර්දේශයක් ලබා දෙන ලෙසත් ය.

පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමාගේ කාර්ය සාධනය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව වගඋත්තරකාර පාර්ශවය විසින් දන්වා තිබුණ ද, 2023 වර්ෂයේ තොරතුරු තාක්ෂණ අංශයෙන් තමා ඉදිරිපත් කළ සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් 2024 වර්ෂයේ ප්‍රධාන ප්‍රතිපාදන සැලසුම් සඳහා (Master procurement plan for 2024 - Capital items හී IT section අංක 3702 other equipment යටතේ අනුමත කර ඇති විශේෂ ව්‍යාපෘති අගෝස්තු හා සැප්තැම්බර් අවසන් කිරීම අනුමත කර ඇත) අනුමත කර ක්‍රියාත්මක කර ඇති කාර්යයන් හා විශේෂ ව්‍යාපෘතිවලින් ඒ බව තහවුරු කළ හැකි බව යි.

තමා සේවය කරන කාලය තුල කිසිඳු වරදකට වරදකරු කර නොමැති බවත්, 2024.07.31 දින තමාගේ සේවය අවසන් කිරීමේ ලිපියටම විවිධ චෝදනා එකතුකර එම චෝදනාවලට වරදකරු සේ සලකා කටයුතු කිරීමෙන් සැලසුම් සහගතව සේවය අවසන් කිරීමට තිබූ අවශ්‍යතාවය පැහැදිලි වන බවත්, 2024.08.01 දින තම රාජකාරිය අවසන්කර පසුව එදින ප.ව.4.09 ට තමාගේ වට්සප් ගිණුමට එලෙස සේවය අවසන් කළ බවට වන පණිවිඩය එවීමට කටයුතු කිරීම යුක්තිසහගත නොමැති බවත්, සී/ස ලංකා සීනි සමාගම, ආයතන සංග්‍රහය හා රජයේ නීති රෙගුලාසි අනුව කටයුතු කරන ආයතනයක් බැවින් මෙවැනි වැදගත් ලිපියක් මේ ආකාරයට යොමු කිරීම සුදුසු නොවන බවත් පැමිණිලිකරු විසින් දක්වා ඇත.

ඒසේම, සේවයෙන් ඉවත්ව යාමට පෙර සේවකයාගේ නිෂ්කාශන කටයුතු කළයුතු වුවත් එය සිදු නොවූ බවත්, භාණ්ඩ බාරදීමට අවස්ථාවක් ලබා දී නොමැති බවත්, ආයතනයෙන් ලබාගත් අත්තිකාරම් ණයද තිබියදී කොන්ත්‍රාත් සේවය අවසන් කළ බවට වන ලිපියට වගඋත්තරකාර පාර්ශවය විසින් අත්සන් තබා ඇත්තේ කිසිඳු සොයා බැලීමකින් තොරව වගකීමක් වගවීමක් නොමැතිව බවත්, එසේ හෙයින් කොන්ත්‍රාත් පත්වීම අවසන් කළ බවට වන ලිපිය අනීතික, පදනමක් නොමැති, පිළිගැනීමට නොහැකි ව්‍යාජ ලියවිල්ලක් බවත්, ආයතනයේ අනෙකුත් කොන්ත්‍රාත් පත්වීම් හිමි සේවකයන්ගෙන් තමාව වෙනස්කොට සළකා රැකියාව කරගෙන යාමට ඇති අයිතිය අභිමිකර තමාව අගෞරවයටත් අපහසුතාවයටත් පත්කර ඇති බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත.

නිසි ක්‍රමවේදයට තමා ඇතුලු නිලධාරීන් 05 දෙනකුට ලබාදී ඇති ස්ථිර පත්වීම් ලිපි, කූඨ ලේඛන බව පවසමින් පොලිස් ස්ථානයට පැමිණිලි කළද, එම චෝදනාව නගමින් තමාගේ පමණක් සේවය නතරකර අනෙක් නිලධාරීන් 04 දෙනා සඳහා වැටුප් ගෙවමින් මේ වන විටත් සේවයේ රඳවාගෙන සිටින බවත්, මෙම පත්වීම් ලිපි , කූඨ ලේඛන බව පැවසුවද ආයතනයේ මානව සම්පතත් අංශයේ සකස්කර ඇති බව

පසුව අනාවරණය කර ගැනීමට තමාට හැකිවූ බවත්, පොලිස් ස්ථානයේ පැමිණිලි කිරීමෙන් මසකට පමණ පසුව අභ්‍යන්තර පරීක්ෂණයක් ආරම්භ කළ බව පැවසුව ද, එම පරීක්ෂණ ද යටපත් කිරීම තුලින් තමාගේ නිර්දෝශීභාවය තහවුරු කිරීමට අවස්ථාවක් නොදී සේවයෙන් ඉවත් කළ බවත්, තමා හෝ වෙනත් නිලධාරියෙක් කිසිඳු අවස්ථාවක , කූඨ ලේඛන සකස්කර නොමැති බවත්, හිටපු අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ගාමිණී රාසපුත්‍ර මහතා විසින් ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය වෙත ලබාදී ඇති ප්‍රකාශයෙන් ද ඒ බව තහවුරු වන බවත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසත් පත්වීම් හා උසස් කිරීම් නිසි බලධාරියා ලෙසත් ඒ මහතා කටයුතු කර ඇති බවත්, එම තනතුර වෙත කාර්ය මණ්ඩල පරිපාලනය සම්බන්ධව සමාගම් පනතින් බලතල පැවරෙන බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

තමා රැකියාවට පැමිණියේ සුදුසුකම් මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට බවත්, කොන්ත්‍රාත් කාලය අවසන් කිරීම හා චෝදනා ඉදිරිපත් කිරීම කාර්යයන් දෙකක් බවත්, එය එකම ලිපියක එකම දිනයක එනම්, කොන්ත්‍රාත් සේවය අවසන් වූ පසුව ලබාදීම ඉඳුරාම රැකියාව නැති කිරීමේ පෞද්ගලික චේතනාවෙන් සිදු කරන ලද්දක් බවත්, වගඋත්තරකරුවන් විසින් තමා ප්‍රසස්ත හා ඵලදායී කාර්යභාරයක් සිදු නොකළ බව පැවසීම සාවද්‍ය බවත්, තමාගේ රාජකාරී කිසිඳු අඩුපාඩුවකින් තොරව සිදුකර ඇති බවත්, එනම්, තමා ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට චන්ද්‍රිකා තාක්ෂණය භාවිතාකර යහපත් කෘෂි පිළිවෙත් කිරීමට නියමු ව්‍යාපෘතියක් සඳහා රුපියල් මිලියන 2.5 ක් ද, කාලගුණ මධ්‍යස්ථානයක් සඳහා රුපියල් මිලියන 0.6ක් ද මීට අමතරව විශේෂ ව්‍යාපෘති 14 ක් පමණ 2024 වසර සඳහා අනුමත කරගෙන ඇති බවත්, එහෙත් 01 වන වගඋත්තරකාර හිටපු සභාපති මේජර් (විශ්‍රාමික) සාරද සමරකෝන් මහතා විසින් මෙම අනුමත ව්‍යාපෘති සඳහා මුදල් ලබාදීම නතර කළ බවත්, මෙවැනි ව්‍යාපෘති තවත් ඉදිරිපත් කළ හැකි බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

එසේම, තම රාජකාරී ප්‍රසස්ථ හා ඵලදායී ලෙස කිරීම වැළැක්වීමට මාධ්‍ය අංශයේ ඇතැම් සේවකයන්ද සම්බන්ධ කරගෙන විවිධ කඩාකප්පල් කිරීම්, බලපෑම් හා මානසිකව විවිධ පීඩා කිරීම්ද වගඋත්තරකාර පාර්ශවය විසින් සිදු කර ඇති බවත්, මේ සම්බන්ධයෙන් තමා පොලීසිය වෙත පැමිණිලි කිහිපයක්ම සිදුකර ඇති බවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ද පැමිණිලි කර ඇති බවත්, ඒ ආකාරයෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් කිසිඳු සහයෝගයක් තමාගේ රාජකාරී සඳහා ලබා නොදී සිටි බවත්, තමා ඉදිරිපත් කර අනුමත කළ ව්‍යාපෘති අවසන් කිරීමේ කාලය 2024 සැප්තැම්බර් මාසය ලෙස තිබියදී සේවා අවශ්‍යතාවක් නොමැති බව පැවසීම සාවද්‍ය බවත් පැමිණිලිකරු විසින් තවදුරටත් සඳහන් කර සිටියි.

තවද, ස්ථිර පත්වීමේ ලිපිය කූඨ ලේඛනයක් වන බවට චෝදනාවට ලක්කර ඇති අනිත් නිලධාරීන් 04 දෙනාගේ කොන්ත්‍රාත් කාලය 2024.08.30 වන දින අවසන්වී තිබියදීත් මෙතෙක් සේවය කරන බැවින් අනෙකුත් කොන්ත්‍රාත් සේවකයන්ගෙන් තමාව වෙනස්කොට සැලකීමක් හා රැකියාව අහිමි කිරීමේ චේතනාවෙන් විවිධ චෝදනා සකස්කර දේශපාලනමය වශයෙන් බලයේ හිඳිමින් අත්තනෝමතික ලෙස

රැකියාවක් කිරීමේ අයිතිය අහිමි කර ඇති බවත්, මේ වන විට තමාගේ ස්ථිර පත්වීම් ලිපිය කූඨ ලේඛනයක් නොවන බව දන්වා වගඋත්තරකාර නිලධාරීන් විසින් ඇඹිලිපිටිය අපරාධ විමර්ශන අංශය වෙත කර ඇති පැමිණිල්ල ඉවත්කර ගැනීම සඳහා ප්‍රකාශයක් ලබා දී ඇති බවත්, එසේ තිබියදීත් ස්ථිර පත්වීම අනුව තමාගේ රැකියාව නැවත ලබා දීමට වගඋත්තරකාර පාර්ශවය ක්‍රියාත්මක නොවන බවත් පැමිණිලිකරු විසින් පෙන්වා දී ඇත.

__නිරීක්ෂණ__

පැමිණිලිකරු 2023.08.01 වන දින සිට 2024.07.31 වන දින දක්වා වසරක කාලයක් සඳහා වගඋත්තරකාර සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම විසින් අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/08 සහ 2023.08.01 දිනැති ලිපිය මගින් කළමණාකාර (තොරතුරු තාක්ෂණය M2-2) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති බව නිරීක්ෂණය වේ. ඉන් අනතුරුව ඉහත කී කොන්ත්‍රාත් කාල සීමාව අවසන් වීමට පෙර පැමිණිලිකරු වෙත අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති එවකට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ගාමිණී රාසපුත්‍ර මහතාගේ අත්සනින් යුත් පත්වීම් ලිපිය ලබා දී 2024.03.06 දින සිට කළමණාකාර (තොරතුරු තාක්ෂණය M2 - 2) තනතුරට ස්ථිර පදනමින් පත් කර ඇති බව ද නිරීක්ෂණය වේ.

එසේ තිබිය දී අංක LSS/AD/HR/01/54 සහ 2024.07.31 වන දිනැති ලිපිය මගින් පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් සේවා කාලය 2024.07.31 වන දින සිට අවසන් කරන බවට 2 වන වගඋත්තරකරු වන එවකට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී මේජර් (විශ්‍රාමික) වජිර කුමාරතුංග මහතාගේ අත්සනින් යුත් ලිපිය ලබා දී ඇති බව ද පෙනී යයි. එකී ලිපිය මගින් පැමිණිලිකරුගේ සේවා කාලය තවදුරටත් දීර්ඝ නොකර අවසන් කිරීමට අදාළව කරුණු ත්‍රිත්වයක් සඳහන් කර ඇත. එනම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධයෙන් පළවන උපලේඛනය යටතේ, විෂමාචාර ක්‍රියාවක් සිදු කළ බවට අනාවරණය වීමෙන් 2024.07.17 දිනැතිව විනය නියෝගයට යටත්වීම, කූඨ ලේඛන සැකසීම සම්බන්ධයෙන් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ අධිකරණ ක්‍රියාමාර්ග පැවතීම සහ ආයතනයේ සාමාන්‍යයෙන් සලකා බලනු ලබන වැටුප් රහිත නිවාඩු 10 ඉක්මවා වැටුප් රහිත නිවාඩු සීමාව ඉක්මවා ලබා තිබීම වශයෙනි.

ඉහත සඳහන් කරුණු ත්‍රිත්වය අතරින් පළමු කරුණ යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධයෙන් පළවන උප ලේඛනය යටතේ, විෂමාචාර ක්‍රියාවක් සිදු කළ බවට අනාවරණය වීමෙන් 2024.07.17 දිනැතිව විනය නියෝගයට පැමිණිලිකරු යටත් කර තිබුණ ද, අදාල විනය නියෝගය පැමිණිලිකරුට ලැබී ඇත්තේ පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් සේවය අවසන් කිරීමෙන් පසුව 2024.08.17 දින ලියා පදිංචි තැපැල් මගින් බව පැමිණිලිකරු පෙන්වා දෙන බැවින් ඒ සඳහා එකඟවීම හෝ විරුද්ධවීම

සම්බන්ධයෙන් කරුණු දැක්වීමකට හෝ අවස්ථාවක් ඒ වන විට කොන්ත්‍රාත් සේවය අවසන් කිරීම මත පැමිණිලිකරු හට නොලැබී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් සේවය අවසන් කිරීමට අදාල ලිපියේ දෙවන කරුණ ලෙස දක්වා ඇත්තේ කූට ලේඛන සැකසීම සම්බන්ධයෙන් ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ අධිකරණ ක්‍රියාමාර්ග පැවතීම යි. පැමිණිලිකරු වෙත වගඋත්තරකාර පාර්ශවය විසින් ලබා දෙන ලද අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති ස්ථිර පත්වීම් ලිපිය, වගඋත්තරකාර පාර්ශවය විසින් ලබාදෙන ලද ලිපියක් නොව කූට ලේඛනයක් සැකසීමක් බවට චෝදනා කර පැමිණිලිකරු ඇතුලු එලෙස ස්ථිර පත්වීම් ලිපි ලබා දී තිබූ 05 දෙනකුට එරෙහිව 4 වන වගඋත්තරකරු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ඉන්දික ජයන්ජු හතරසිංහ යන අය විසින් ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය වෙත 2024.06.25 වන දින පැමිණිලිකර ඇති බවත්, ඒ අනුව එම පැමිණිල්ලට අදාළව ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය විසින් ඇඹිලිපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ නඩුවක් පවරා ඇති බවත් නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් එකී ස්ථිර පත්වීම් ලිපි සඳහා අත්සන් තබා ඇති එවකට සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ හිටපු අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ගාමිණී රාසපුත්‍ර මහතා විසින් ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය වෙත 2024.07.12 වන දින පැය 14.10ට ප්‍රකාශයක් ලබා දෙමින් එම ස්ථිර පත්වීම් ලිපිවල අත්සන් තබා ඇත්තේ තමා විසින් බවත්, ඒ අනුව මෙම පත්වීම් ලිපි නීත්‍යානුකූල ලේඛන වන බවත් ප්‍රකාශ කර ඇති බව ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන අංශයේ තොරතුරු පොතෙහි පිටුව 271 සහ ඡේදය 68 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

තවද, ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය වෙත ඉහත කී පැමිණිල්ල ඉදිරිපත් කරන ලද 4 වන වගඋත්තරකරු වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ඉන්දික ජයන්ජු හතරසිංහ යන අය විසින් 2024.10.17 වන දින පැය 11.40ට නැවත ප්‍රකාශයක් එම කාර්යාංශය වෙත ලබා දී ඇති අතර එහිදී පැමිණිලිකරු ඇතුලු නිලධාරීන් 05 දෙනා හට ස්ථිර කිරීමේ පත්වීම් ලිපි නිසි ක්‍රමවේදයට අනුව නොලැබීම සම්බන්ධයෙන් සමාගමේ පාලන අධිකාරියට ඇති වූ ගැටළුව හේතුවෙන් තමා වෙත ලබාදුන් නියෝග හා උපදෙස් පරිදි අදාල ලිපි ලේඛන ඉදිරිපත් කරමින් විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය වෙත පැමිණිලි ගොණු කළ බවත්, පසුකාලීනව ලද තොරතුරු මත ආයතනයේ හිටපු අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී ගාමිණී රාසපුත්‍ර මහතා විසින් ඔහුගේ අත්සන සහිතව මෙම පත්වීම් ස්ථිර කිරීමේ ලිපි 05 නිකුත්කර ඇති බව දැනගැනීමට ලැබුණු බවත්, ඔහුට සමාගම් පනත ප්‍රකාරව පාලනය සම්බන්ධ බලතල හිමිව තිබෙන බවත්, ඒ අනුව මෙම ස්ථිර පත්වීම් ලිපි නිකුත් කර ඇති බවත්, එකී ලිපි වල ඇති ලිපි ශීර්ෂ නීත්‍යානුකූල ලිපි ශීර්ෂ බව අනාවරණය වී ඇති බවත් ප්‍රකාශ කර ඇති බව ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන අංශයේ තොරතුරු පොතෙහි පිටුව 395 සහ ඡේදය 92 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරුගේ ස්ථිර පත්වීම් ලිපිය කූඨ ලේඛනයක් නොවන බව වගඋත්තරකාර පාර්ශවය විසින් අනාවරණය කරගෙන ඇති බව සනාථ වේ. එසේවුවද, පැමිණිලිකරු හට එකී ස්ථිර පත්වීම් ලිපිය ප්‍රකාරව නැවත සේවයෙහි පිහිටුවීමට වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියා කර නොමැති බව ද නිරීක්ෂණය වේ. එසේම, කූඨ ලේඛන සැකසීමේ චෝදනාව පැමිණිලිකරු ඇතුළු කොන්ත්‍රාත් සේවයේ සිටි නිලධාරීන් 05 දෙනකුට විරුද්ධව එල්ලවී ඇතත් පැමිණිලිකරු හැර අනෙක් 04 දෙනා තවදුරටත් සේවා කණ්ඩනයකින් තොරව වගඋත්තරකාර සමාගමේ කොන්ත්‍රාත් සේවයේ නිරතව වැටුප් ලබන බවත් අනාවරණය වේ.

තවද, පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් සේවය අවසන් කිරීමට අදාළ තුන්වන කරුණ ලෙස ආයතනයේ සාමාන්‍යයෙන් සලකා බලනු ලබන වැටුප් රහිත නිවාඩු 10 ඉක්මවා වැටුප් රහිත නිවාඩු ලබා තිබීම ලෙස දක්වා ඇත. 2024.03.06 දින පැමිණිලිකරුගේ පත්වීම ස්ථිර කරමින් ලිපිය ලැබීමෙන් පසුව 2024.06.04 දින පැමිණිලිකරු විසින් 4 වන වගඋත්තරකරු වන නියොජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වෙත ලිපියක් යොමු කරමින් ස්ථිර පත්වීමට අදාල වැටුප්, දීමනා හා අනුමත නිවාඩු ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා ඇති බවත්, ඒ සඳහා වගඋත්තරකාර පාර්ශවය විසින් නිසි ප්‍රතිචාරයක් දක්වා නොමැති බවත්, පසුව ස්ථිර පත්වීම් ලිපිය කූඨ ලේඛනයක් බවට දක්වා 4 වන වගඋත්තරකරු විසින්ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යංශය වෙත පැමිණිල්ලක් කර ඇති බවත් පෙනී යයි. එසේ හෙයින් පැමිණිලිකරු වෙත ලබා දෙනු ලැබූ 2024.03.06 දිනැති ස්ථිර පත්වීම් ලිපිය, කූඨ ලේඛනයක් ලෙසට සලකා වගඋත්තරකාර පාර්ශවය කටයුතු කිරීම හේතුවෙන් ඔහු හට ස්ථිර සේවකයෙකුට හිමිවන නිවඩු ලබාගත නොහැකි වී ඇති බවත්, ඔහු විසින් ලබාගත් නිවාඩු කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් සේවකයෙකුට හිමිවන නිවාඩු ප්‍රමාණය අනුව ගණනය කිරීම හේතුවෙන් ඉහත කී තුන්වන කරුණ ඇතුළත් කර ඇති බවත් නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේදී පැමිණිලිකරු හට ලබාදී ඇති කළමණාකාර (තොරතුරු තාක්ෂණය M2-2) තනතුරට අදාල ස්ථිර පත්වීම් ලිපිය ඇතුළු නිලධාරීන් 05 දෙනකුට ලබා දුන් ස්ථිර පත්වීම් ලිපි කූඨ ලේඛන බවට චෝදනාකර පැමිණිලිකරු ඇතුළු එම නිලධාරීන් 05 දෙනාට එරෙහිව 4 වන වගඋත්තරකරු විසින් 1 වන සහ 3 වන වගඋත්තරකරුවන්ගේ උපදෙස් සහ දැනුම්දීම මත ඇඹිලිපිටිය විශේෂ අපරාධ විමර්ශන කාර්යාංශය වෙත පැමිණිලි කිරීම හේතුවෙන් පැමිණිලිකරුට එරෙහිව ඇඹිලිපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 1236/24 යටතේ නඩු පවරා ඇති බව නිරීක්ෂණය වේ.

රජයේ හෝ පුද්ගලික ආයතන සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන්ගේ සේවය අදාල කොන්ත්‍රාත් කාලය අවසන් වීමේදී අවසන් කිරීමට එම ආයතනවලට නීතිමය හැකියාවක් පවතී. එසේ වුවත් පැමිණිලිකරු සමඟම සේවා කාලය අවසන් වීමට නියමිතව සිටි කූඨ ලේඛන සකස් කළා යැයි චෝදනා ලැබ ඇති අනෙකුත් කොන්ත්‍රාත් සේවා නිලධාරීන්ගේ කොන්ත්‍රාත් සේවය අවසන් නොකර

පැමිණිලිකරුගේ පමණක් කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇති අතර, පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් සේවය අවසන් කිරීමට අදාළ කරගනු ලැබූ බවට එම සේවය අවසන් කිරීමේ ලිපියේ දක්වා තිබූ කරුණු සම්බන්ධයෙන් ද යම් යම් ගැටළුකාරී තත්ත්වයන් පවතින බව ද ඉහතින් දක්වා ඇත.

එසේහෙයින්, කූට ලේඛන සකස් කළා යැයි චෝදනා ලැබ ඇති අනෙකුත් කොන්ත්‍රාත් සේවා නිලධාරීන් හතරදෙනාගේ කොන්ත්‍රාත් සේවය අවසන් නොකර පැමිණිලිකරුගේ පමණක් කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරීම තුළින් පැමිණිලිකරු වෙනස් කොට සැලකීමකට ලක් කර ඇති බවත්, ඒ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන, 2වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, පැමිණිලිකරු වෙත ලබා දී ඇති අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති ස්ථිර පත්වීම් ලිපිය කූට ලේඛනයක් නොවන බවට වගඋත්තරකාර පාර්ශවය විසින් අනාවරණය කරගෙන තිබුණ ද, පැමිණිලිකරු හට ඔහුගේ රැකියාව නැවත ලබාදීමට කටයුතු නොකිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 14(උ) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීත්‍යානුකූල රැකියාවක හෝ වෘත්තියක නියුක්ත වීමට ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ද 1 වන, 2වන, 3 වන සහ 4 වන වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.**

01. අංක එල්එස්එස්/ඒඩී/එච්ආර්/01/07 සහ 2024.03.06 දිනැති ස්ථිර පත්වීම් ලිපිය ප්‍රකාරව පැමිණිලිකරු නැවත සේවයෙහි පිහිටුවීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතු ය.

02. පැමිණිලිකරුගේ ස්ථිර පත්වීම බලාත්මක කර ස්ථිර පත්වීම ලද 2024.03.06 දින සිට ස්ථිර සේවයේ වැටුප ගෙවීමට කටයුතු කළ යුතු අතර, එසේම ඉහත විස්තර කර ඇති පරිදි වගඋත්තරකරුවන්ගේ අත්තනෝමතික, නීතියට පටහැනි ක්‍රියා කලාපය නිසා පැමිණිලිකරුට අහිමි වී ඇති අනෙකුත් සියලු දීමනා හා වරප්‍රසාද ලබාදීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යුතු ය.

03. මෙම සිදුවීමේ දී අදාළ බලධාරීන් ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා එවැනි සිදුවීම් සහ තත්ත්වයන් යළි ඇති නොවීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පියවර ගත යුතු අතර, ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2025. 03 . 27 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී .පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා,
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව
සංවර්ධන අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.
- කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්,
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව
සංවර්ධන අමාත්‍යාංශය,
අංක 73/1, ගාලු පාර,
කොළඹ 03.
- අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා